සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණක් යොදන්න.

01. ෂැනෝන්, වීවර් හා හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘති දෙකෙහිම අන්තර්ගත සන්නිවේදන මූලිකාංගයක් වන්නේ,
(1) බලපෑමයි. (2) සන්නිවේදකයායි. (3) අග්‍රස්ථානයයි. (4) ග්‍රාහකයායි.

02. සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීම කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,
(1) ප්‍රතිපෝෂණයයි. (2) දොරටුපාල ක්‍රියාවලියයි.
(3) සංජානනයයි. (4) ශ්‍රවණ නිපුණතාවයයි.

03. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන නිපුණතා වර්ධනය කර ගැනීම සමාජීය ජීවිතයේ දී වඩාත් ම වැදගත් වීමට හේතුවක් වන්නේ,
(1) පුද්ගල චර්යාවන් පාලනය කිරීමයි. (2) තීරණ ගැනීමේ කාර්යය සිදු කිරීමයි.
(3) ස්ව සංකල්පය පෝෂණය කිරීමයි. (4) මතකය වර්ධනය කර ගැනීමයි.

04. විභේදන බලය වැඩි ඡායාරූපයක්
(1) ගුණාත්මක බවින් අඩුවේ.
(2) ගුණාත්මක බවින් වැඩිවේ.
(3) අඳුරු පැහැ වේ.
(4) අපැහැදිලි වේ.

05. පෞද්ගලික ජනමාධ්‍ය ආයතනයක මූලික ම අරමුණකි,
(1) සමාජ අරමුණු ඉටු කිරීම. (2) වෙළඳ අරමුණු ඉටු කිරීම.
(3) දේශපාලන අරමුණු ඉටු කිරීම. (4) ගෝලීය අරමුණු ඉටු කිරීම.

06. කාන්තාවක් සාරියක් ඇඳ, කර වටා වෙද නළාවක් පැළැඳ සිටියි. මෙයින් නිරූපණය කරන්නේ,
(1) පාරිසරික සාධක මත කෙරෙන අවාචික සන්නිවේදනයයි.
(2) සමාජීය සාධක මත කෙරෙන අවාචික සන්නිවේදනයයි.
(3) ශාරීරික සාධක මත කෙරෙන අවාචික සන්නිවේදනයයි.
(4) වෘත්තීය සාධක මත කෙරෙන අවාචික සන්නිවේදනයයි.

07. සන්නිවේදන ස්වරූපයක් යන්නෙන් අදහස් වන්නේ,
(1) අදහස් හුවමාරු කර ගැනීමකි.
(2) භාෂාව යොදා ගනිමින් සන්නිවේදනයේ යෙදෙන අවස්ථාවකි.
(3) ග්‍රාහකයා තොරතුරු ලබා ගන්නා ආකාරයකි.
(4) මිනිසාගේ මානව ගුණාංග හා බැඳුණු තත්වයකි.

08. නූතන දෘශ්‍ය මාධ්‍ය පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.
(1) දුම, අත්පත්‍රිකා, චිත්‍ර, පොත් පිංච
(2) චිත්‍ර, බිත්ති සටහන්, ධාරා සටහන්, මාර්ග සංඥා
(3) දුම, ගස්වල එල්ලූ කොළ අතු, බිත්ති සටහන්, මාර්ග සංඥා
(4) මාර්ග සංඥා, ධාරා සටහන්, අත් පත්‍රිකා, පෝස්ටර්

09. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
  (1) වාචික සන්නිවේදනය අවාචික සන්නිවේදනයට වඩා ප්‍රබල වෙයි.
  (2) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය මගින් ආගමික හා සංස්කෘතික වටිනාකම් පැහැදිලි කරයි.
  (3) අවිධිමත් සන්නිවේදනය ආයතනික කටයුතුවලදී වැදගත් වෙයි.
  (4) දමිළ භාෂාව තුළ භාෂා ද්විරූපතාවයක් දක්නට ලැබෙයි.

10. පරිගණකයේ ආගමනයට පෙර ආදේශකයක් ලෙස භාවිත කරනු ලැබුයේ,
  (1) ඩොට් මුද්‍රණ යන්ත්‍රයයි. (2) රෝනියෝ යන්ත්‍රයයි.
  (3) යතුරු ලියනයයි. (4) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි.

11. A - පුවත්පත දවසේ කිහිප වාරයක් මුද්‍රණය වීම.
  B - යථාකාර වැඩසටහන් අවම පිරිවැයකින් හා අවම ශ්‍රමයක් යොදා ගනිමින් නිෂ්පාදනය කිරීම.
  C - ලිඛිත සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල, ෆැක්ස් යන්ත්‍රය භාවිත කළ හැකි වීම.

  මෙම ප්‍රකාශවලින්,
  (1) A හා B සත්‍ය වේ. (2) B හා C සත්‍ය වේ.
  (3) A හා C සත්‍ය වේ. (4) A, B, C සියල්ලම සත්‍ය වේ.

12. පෞද්ගලික මාධ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
  (1) ආයතනික ව්‍යුහය පුළුල් වීම.
  (2) ජනප්‍රිය වින්දනය සඳහා වැඩසටහන් නිෂ්පාදනය කිරීම.
  (3) අරමුණු සීමිත වීම.
  (4) ව්‍යාපාර හිමිකරුවන්ගේ ප්‍රතිපත්තිමය තීරණ මත ක්‍රියාත්මක වීම.

13. මාධ්‍ය ආයතනයක සභාපතිගේ සෘජු අධීක්ෂණයට යටත්වන පුද්ගල කණ්ඩායමක් නොවන්නේ,
  (1) සංස්කාරක මණ්ඩලය (2) කර්තෘ මණ්ඩලය
  (3) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් (4) මාණ්ඩලික මාධ්‍යවේදීන්

14. රාජ්‍ය හිමිකාරත්වය යටතේ දිනපතා මුද්‍රණය වන ජාතික පුවත්පතකි,
  (1) ලංකාදීප (2) සිළුමිණ (3) දිවයින (4) රාවය

15. ජනමාධ්‍ය මගින් දේශාභිමානී ගීත ඉදිරිපත් කිරීම තුළින් අපේක්ෂා කළ යුත්තේ,
  (1) දේශය පිළිබඳ ඇල්මක් ඇති කිරීමයි. (2) සංවර්ධනාත්මක චින්තනය ඇති කිරීමයි.
  (3) රසවින්දනය වර්ධනය කිරීමයි. (4) දේශීය භෞතික හා මානව සම්පත් අගය කිරීමයි.

16. මිනිසාගේ පියවි ඇසට පෙනෙන දර්ශන ලබා ගැනීම සඳහා ඡායාරූප ශිල්පියෙකු භාවිත කළ යුතු කාච වර්ගය වන්නේ,
  (1) පුළුල් කෝණ කාචයි. (2) යුහුබූ කාචයි.
  (3) දුර රූප කාචයි. (4) සාමාන්‍ය කාචයි.

17. මෙම A, B, C, D යන රූප රාමුවල අනුපිළිවෙල වන්නේ,




  (1) දුර රූපය, අති සමීප රූපය, මධ්‍ය රූපය, සමීප රූපය
  (2) අති සමීප රූපය, මධ්‍ය රූපය, දුර රූපය, සමීප රූපය
  (3) දුර රූපය, සමීප රූපය, මධ්‍ය රූපය, අති සමීප රූපය
  (4) මධ්‍ය රූපය, සමීප රූපය, අති සමීප රූපය, දුර රූපය

18. සාර්ථක ඡායාරූප ශිල්පියෙකු වීම සඳහා වඩාත් වැදගත් වන්නේ,
  (1) කැමරාවක තාක්ෂණික අංග පිළිබඳ දැනුම හා නිර්මාණශීලී හැකියාවයි.
  (2) හොඳ කැමරාවක් හා තාක්ෂණික අංග පිළිබඳ දැනුමයි.
  (3) හොඳ කැමරාවක් හා නිර්මාණශීලී හැකියාවයි.
  (4) හොඳ කැමරාවක් හා ආචාර ධර්ම පිළිබඳ අවබෝධයයි.

19. ඕනෑම නිශ්චල කැමරාවක අන්තර්ගත විය යුතු තාක්ෂණික අංග වන්නේ,
   (1) කාචය, විවරය හා සේයා පටලයයි.
   (2) කැමරා කාචය, කාච විවරය හා ද්වාරයයි.
   (3) සේයා පටලය, කාච ආවරණය හා විවරයයි.
   (4) විද්‍යුත් ක්ෂණිකාව ලෝකනය, විවරය හා සේයා පටලයයි.

20. ප්‍රවෘත්තියක් තුළ තිබිය යුතු විශේෂ ගුණාංගයක් නොවන්නේ,
   (1) මානව ලැදියාව යි. (2) කැපී පෙනීම යි. (3) සමීප බවයි. (4) සංක්ෂිප්ත බවයි.

21. එක්තරා පුවත්පතක අන්තර්ගත වූ ප්‍රවෘත්ති කිහිපයක් පහත දැක්වේ.

   A - වැඳූ මව සොයා ඇමරිකානු දියණියක් ශ්‍රී ලංකාවට.
   B - දුම්රිය වැඩ වර්ජනයෙන් ජනතාව දැඩි අපහසුතාවයට.
   C - පළාත් සභා ඡන්දය කල් යන ලකුණු.
   D - අසූ වියැති පියා ආබාධිත පනස් අට වියැති පුතු රැක බලා ගනියි.

   මේවායින් මෘදු පුවත් ප්‍රභේදයට අයත් වන්නේ,
   (1) A හා B පමණි. (2) B හා D පමණි. (3) C හා D පමණි. (4) A හා D පමණි.

22. පසුගිය වසරේ තම ප්‍රදේශයේ සිදු වූ හදිසි අනතුරු පිළිබඳ ව්‍යාපෘතියක් කිරීමට කමල් තීරණය කරයි. ඒ සඳහා ඔහුට තොරතුරු ලබා ගැනීමට යෝග්‍යතම මූලාශ්‍රය වන්නේ,
   (1) පුද්ගල මූලාශ්‍රයි. (2) ආයතනික මූලාශ්‍රයි. (3) මාධ්‍ය මූලාශ්‍රයි. (4) ලිඛිත මූලාශ්‍රයි.

23. විජය, මිහිර, විදුසර, සුජය වැනි ළමා පුවත්පත් අයත් වන ප්‍රමාණ කාණ්ඩය වන්නේ,
   (1) ටැබ්ලොයිඩ් ය. (2) බ්‍රොඩ්ෂීට් ය. (3) බර්ලීනර් ය. (4) කොම්පැක්ට් ය.

24. පුවත්පතක පළවන ලිපි සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   කුමාරි - පුවත්පතක කතු වැකිය මඟින් දක්වන්නේ කර්තෘගේ පෞද්ගලික අදහසකි.
   නිමාලි - කාටුන් යනු උපහාසය නිර්මාණශීලීව යොදා ගනිමින් සමාජ විවරණයක යෙදෙන ආකෘතියකි.
   විනීතා - පුවත්පතක් සැලසුම් කිරීමේ දී මුලින්ම ඉඩකඩ වෙන් කරනු ලබන්නේ ප්‍රධාන ප්‍රවෘත්තිවලටයි.
   සමන්තා - විශේෂාංග ලිපිවල උදෘතපාඨ, කවි පන්ති, යෝජනා ආදී ආකෘතීන් දක්නට ලැබෙනවා.
   මෙයින් සාවද්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
   (1) කුමාරී හා නිමාලී ය. (2) නිමාලී හා විනීතා ය. (3) විනීතා හා සමන්තා ය. (4) කුමාරී හා විනීතා ය.

25. ආසියාවේ ප්‍රථම ගුවන්විදුලි සේවය වන්නේ,
   (1) ඉන්දියානු ගුවන් විදුලි සේවය යි. (2) ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය යි.
   (3) මැලේසියානු ගුවන් විදුලි සේවය යි. (4) රුසියානු ගුවන් විදුලි සේවය යි.

26. දක්ෂ ගුරුභවතෙකු විසින් දුෂ්කර පාසලක දූ දරුවන්ට ඉංග්‍රීසි භාෂාව චතුර ලෙස හැසිරවීමට මඟ පෙන්වීම නිසා එම පාසල ප්‍රසිද්ධියට පත් විය. රූපවාහිනි නිෂ්පාදකයෙක් මේ පිළිබඳව කිසියම් රූපවාහිනී නාලිකාවකට වැඩසටහනක් සම්පාදනය කිරීමට තීරණය කරයි. ඒ සඳහා ඔහුට යොදා ගැනීමට යෝග්‍යතම වැඩසටහන් ප්‍රභේදය වන්නේ,
   (1) වාර්තා වැඩසටහනකි. (2) සඟරාමය වැඩසටහනකි.
   (3) විචිත්‍රාංග වැඩසටහනකි. (4) ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහනකි.

27. වෘත්තිමය සීමා හා සෞන්දර්යාත්මක නියමයන් වෙනස් කරමින් නව ආරකින් යුතුව ඉදිරිපත් කරන රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදය වන්නේ,
   (1) මෙගා නාට්‍යය ය. (2) විචිත්‍රාංගමය වැඩසටහන් ය.
   (3) යථාකාර වැඩසටහන් ය. (4) සංගීත වැඩසටහන් ය.

28. ''පාවහන් හා හිස් වැසුම් ගලවා ඇතුලු වන්න'' යන්න ප්‍රදර්ශනය කිරීම තුළින් ඉදිරිපත් කෙරෙන සන්නිවේදන ස්වරූපය වන්නේ,
   (1) වාචික සන්නිවේදනය යි. (2) නිර්වාචික සන්නිවේදනය යි.
   (3) දෘශ්‍ය සන්නිවේදනය යි. (4) ලිඛිත සන්නිවේදනය යි.

29. නූතන ජන මාධ්‍යයක් නොවන්නේ,
   (1) පුවත්පත යි. (2) ගුවන් විදුලිය යි. (3) රූපවාහිනිය යි. (4) වෙබ් ගුවන්විදුලිය යි.

30. නිමල් අධ්‍යාපනයට මුල් තැන දෙයි. එහෙත් ඔහු තෝරා ගත් රූපවාහිනී වැඩසටහන් කිහිපයක් නරඹයි. එම වැඩසටහන් පිළිබඳ ව තම ප්‍රතිචාර ද දන්වා යවයි. ඔහු,
   (1) නිෂ්ක්‍රීය ග්‍රාහකයෙකි. (2) විචාරශීලී ග්‍රාහකයෙකි.
   (3) සක්‍රීය ග්‍රාහකයෙකි. (4) උදාසීන ග්‍රාහකයෙකි.

31. සමන් හා කුමාර ස්කයිප් යොදා ගනිමින් විදේශගත මිතුරෙකු සමඟ දුරකතන සාකච්ඡාවක නිරත වෙයි. මෙය අයත් වන සන්නිවේදන වර්ගය වන්නේ,
   (1) ජන සන්නිවේදනය යි. (2) අව්‍යිමත් සන්නිවේදනය යි.
   (3) සමූහ සන්නිවේදනය යි. (4) පුද්ගලාන්තර සන්නිවේදනය යි.

32. පුවත්පත මඟින් දරණ මතය හෙළිදරව් වන ප්‍රධානතම ලියවිල්ල වන්නේ,
   (1) තීරු ලිපිය යි. (2) කතු වැකිය යි. (3) කාටූනය යි. (4) දේශපාලන විග්‍රහයයි.

33. පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආරම්භ කර පවත්වාගෙන යාමට බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ,
   (1) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවයි. (2) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවයි.
   (3) ජනමාධ්‍ය අමාත්‍යාංශයයි. (4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි.

- **කිසියම් උපකරණ විශේෂයක් සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් 34 සහ 35 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

   A - පිරිවැය අවම ය.
   B - උපකරණ හා දත්ත පෙර සැලසුම් කළ යුතුය.
   C - භාවිතය සඳහා තාක්ෂණික දැනුම අවශ්‍ය ය.
   D - පන්ති කාමර ඉගැන්වීම් සඳහා බහුලව යොදා ගත හැකිය.
   E - විවිධ තොරතුරු සජීවීව ඉදිරිපත් කළ හැකිය.

34. බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය හා සම්බන්ධ නිවැරදි කරුණු ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) B, C, E ය. (2) A, C, D ය. (3) A, B, C ය. (4) B, D, E ය.

35. ප්‍රක්ෂේපණීය නොවන උපකරණවල ලක්ෂණ වන්නේ,
   (1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) A හා D ය.

36. උද්ඝෝෂණ, පෙළපාළි ආදියේ දී භාවිත කරනු ලබන කථන සන්නිවේදන උපකරණයක් වන්නේ,
   (1) ශබ්ද විකාශන යන්ත්‍රය (2) රැහැන් රහිත මයික්‍රෆෝනය
   (3) මෙගා ෆෝනය (4) ක්ලිප්ෆෝනය

37. ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය පාලනය කිරීමට රජය ඍජුවම ඉදිරිපත් නොවන්නේ,
   (1) ජනමාධ්‍ය සංගම්වලට ඇති බිය නිසාය. (2) ප්‍රකාශන නිදහස නීතිගත කොට ඇති නිසාය.
   (3) රජයට බලයක් නොමැති නිසාය. (4) ජනමාධ්‍ය රජයට ප්‍රයෝජනවත් නිසාය.

38. ජනමාධ්‍ය මඟින් බහුල වශයෙන් ප්‍රතිරූප ගොඩනැංවීම සිදු කරන්නේ,
   (1) දේශපාලඥයන්, නළු නිළියන් හා ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ ය.
   (2) ව්‍යාපාරිකයන්, නළු නිළියන් හා ගායක ගායිකාවන්ගේ ය.
   (3) දේශපාලඥයන්, ගීත රචකයන් හා ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ ය.
   (4) සූපවේදීනියන්, බලවතුන් හා ප්‍රවීණ ගායකයන්ගේ ය.

39. ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා ආරම්භ කිරීමේ වැදගත් අරමුණ වන්නේ,
   (1) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට රැකියා අවස්ථා වැඩි කිරීමට යි.
   (2) ප්‍රාදේශීය ජනතාව සංවර්ධන ක්‍රියාවලියට සහභාගි කර ගැනීමටයි.
   (3) ප්‍රාදේශීය වශයෙන් විකාශන කටයුතු කිරීමට පහසු වීමයි.
   (4) ප්‍රාදේශීය ජනතාවගේ රසඥතාවය වර්ධනය කිරීමයි.

40. බොහෝ රූපවාහිනී නාලිකාවලට ළමයා වැදගත් වන්නේ,
   (1) රූපවාහිනිය නැරඹීමට දැඩි රුචිකත්වයක් දක්වන්නෙකු බැවිනි.
   (2) වින්දනය අපේක්ෂා කරන්නෙකු බැවිනි.
   (3) මාධ්‍ය පවත්වාගෙන යාමට උපකාර කරන්නෙකු බැවිනි.
   (4) පාරිභෝගිකයෙකු වන බැවිනි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II**

| නම/ විභාග අංකයඃ |
|---|

වැදගත් :

- පළමුවන ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
  පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.

---

01 සුගත් හා විමල් යහළුවන් දෙදෙනෙකි. සුගත් නූතන මාධ්‍ය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන අතර විමල් මාධ්‍ය සංදේශය හා ග්‍රාහකයා අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට උපකාර කරන්නෙකි.

(i) සුගත් නිර්මාණ ඉදිරිපත් කරන නූතන මාධ්‍ය දෙකක් නම් කරන්න.

(ii) විමල් කුමන පුද්ගලයෙක් ලෙස හැඳින්විය හැකිද?

(iii) සුගත් ජාතික පුවත්පතකට නිසඳැස්, කෙටිකතා ආදිය නිර්මාණය කර යවනු ලැබේ. එහි දී ඔහු සම්බන්ධ වන සන්නිවේදන වර්ගය වන්නේ කුමක් ද?

(iv) මොහු නිර්මාණය කර යැවූ පද්‍ය නිර්මාණයක් පුවත්පතෙහි පළ වී තිබුණි. එහෙත් එහි ඇතැම් කවි පදවල අකුරු බොඳවීම නිසා අපහැදිලි විය. එය කුමන බාධක වර්ගයට අයත්වේද?

(v) කෙටි කතා නිර්මාණයේ දී ඔහු යොදා ගන්නට ඇතැයි සිතිය හැකි සංකල්පය නම් කරන්න.

(vi) සුගත් නිර්මාණය කළ ගී පද රචනයක් ප්‍රවීණ ගායක වසන්ත මහතා විසින් ගුවන්විදුලි සංගීත වැඩසටහනක් ඔස්සේ ගායනා කළේය. ඔහු ගීතය ගායනා කිරීමට පෙර ගීපද රචකයාගේ නම හා තනු නිර්මාණය කළ පුද්ගලයාගේ නම සඳහන් කළේය. ඔහු එසේ කිරීමෙන් ආරක්ෂා කරනු ලැබූයේ කිනම් ප්‍රකාශන හිමිකම් සම්බන්ධ අයිතිවාසිකමද?

(vii) නිර්මාණකරණයේ දී නිර්මාණකරුවන්ට ප්‍රකාශන හිමිකම් සම්බන්ධයෙන් අවබෝධයක් තිබිය යුතුය. ප්‍රකාශන හිමිකම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ප්‍රධාන ලියකියවිලි දෙක නම් කරන්න.

(viii) රූපවාහිනී ප්‍රවෘත්ති නැරඹීම ද සුගත්ගේ දින චර්යාවේ අනිවාර්ය අංගයකි. ප්‍රවෘත්ති නැරඹීම තුළින් සිදු වන ප්‍රධාන සන්නිවේදන කාර්යය දක්වන්න.

(ix) සුගත් මෙන් ම විමල් ද නූතන මාධ්‍ය පමණක් නොව අභිසාරී මාධ්‍යය ද භාවිත කරයි. අභිසාරී මාධ්‍ය දෙකක් නම් කරන්න.

(x) විමල් පුවත්පතකට ලිපියක් ඉදිරිපත් කරමින් දක්වා තිබුණේ වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතයේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම බිඳ වැටී ඇති බවයි. එසේ බිඳ වැටී ඇති සමාජ මාධ්‍ය ආචාර ධර්ම 02 ක් ලියන්න. (ල. $2 \times 10 = 20$)

02. සදහම් පාසලේ ශිෂ්‍ය නායක මණ්ඩලය ව්‍යාපෘතියක් ලෙස මං සලකුණු පද්ධතියක් සකස් කිරීමට තීරණය කළෝය. ඒ සඳහා විධිමත් ආකාරයට විදුහල්පතිතුමාගෙන් අවසර ගනු ලැබුණි.

(i) මං සලකුණු පද්ධතිය කුමන සන්නිවේදන ස්වරූපයට අයත්වේ ද? (ල.01)

(ii) පාසල තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අකාරය පැහැදිලි කරන්න. (ල.02)

(iii) ව්‍යාපෘතිය අවසානයේ එහි වාර්තාව සැකසීම සඳහා පරිගණකය භාවිතා කිරීමට තීරණය කරන ලදී. වාර්තාවේ නිමි කටයුතු සඳහා යොදා ගනු ලබන පරිගණකය ආශ්‍රිත ප්‍රකාශන උපකරණ 02 ක් නම් කර කෙටියෙන් හඳුන්වන්න. (ල.03)

(iv) විදුහල්පතිතුමා විසින් උදෑසන රැස්වීමේදී ව්‍යාපෘතිය කිරීමට මූලිකත්වය ගත් සිසුවාගේ නම ඉදිරිපත් කරමින් ඇගයීමට ලක් කරන ලදී. එතුළින් ඔහුට පාසල තුළ යහපත් සමාජ ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට හැකි විය. ''සමාජ ප්‍රතිරූපයක්'' යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ල.04)

03. සෑම ජනමාධ්‍යයක් මඟින් ම විවිධ අංශ නියෝජනය කරනු ලබයි.

(i) ජනමාධ්‍ය මගින් නියෝජනය කරන ප්‍රධාන අංශ දෙකක් නම් කරන්න. (ල.01)

(ii) ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔබ තුළ තිබිය යුතු ගුණාංග දෙකක් දක්වන්න. (ල.02)

(iii) වැඩ ලෝකයේ ඉල්ලුම පිළිබඳව වර්තමාන තරුණ තරුණියන්ට අවබෝධයක් නොමැති බව රැකියා විරහිත භාවය තුළින් පෙනේ. එම තත්වය අවම කිරීමට ජනමාධ්‍යයකට මැදිහත්විය හැකි ආකාර 03 ක් පැහැදිලි කරන්න. (ල.03)

(iv) ජනතාව තුළ සංවර්ධනාත්මක චින්තනය ඇති කිරීම ද ජනමාධ්‍ය මඟින් අවම මට්ටමකින් සිදු වන බව පෙනේ. එසේ වීමට බලපා ඇති හේතු 04 ක් පැහැදිලි කරන්න. (ල.04)

04. නිර්මාල් පුවත්පත් මාධ්‍ය ආයතයනයකට සම්බන්ධ මාණ්ඩලික මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කරයි.

(i) මාණ්ඩලික මාධ්‍යවේදියෙකු සතු ලක්ෂණ 02 ක් දක්වන්න. (ල.01)

(ii) සුනිමල් පුවත්පතේ ප්‍රධාන කර්තෘ වේ. ඔහු සතු ප්‍රධාන කාර්යයන් 02 ක් දක්වන්න. (ල.02)

(iii) පුවත්පත් මාධ්‍ය ආයතනයක දක්නට ලැබෙන ප්‍රධාන අංශ 04 ක් නම් කර දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ල.03)

(iv) වර්තමානයේ අන්තර්ජාලය හරහා ද පුවත්පත කියවීමේ හැකියාව ලැබී ඇත. විද්‍යුත් පුවත්පත් ආකාර දෙක නම් කර පැහැදිලි කරන්න. (ල.04)

05. විශ්ව විද්‍යාල සිසුන් විසින් විවිධ ඉල්ලීම් මුල් කර ගනිමින් විරෝධතා පා ගමනක් සංවිධානය කර තිබුණි.

(i) ඉහත සිදුවීම රූපවාහිනි ප්‍රවෘත්ති විකාශනය සඳහා සජීවී රූප සහිතව වාර්තා කිරීමට අවශ්‍ය උපකරණයක් දක්වන්න. (ල.01)

(ii) මෙම පාගමන පිළිබඳව ප්‍රවෘත්ති වාර්තාවක් සැකසීමේ දී ඔබ අවධානය යොමු කළ යුතු කරුණු තුනක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.02)

(iii) ඔබේ වාර්තාව හා ඡායාරූප රූපවාහිනි මාධ්‍ය ආයතනයකට විද්‍යුත් තැපැල මගින් යවනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි 03 ක් දක්වන්න. (ල.03)

(iv) විරෝධතා පා ගමන පිළිබඳව ප්‍රවෘත්තිය පුවත්පතක ද ඡායාරූපයක් සමඟ පළ කර තිබුණි. වාර්තාකරණ ඡායාරූපයක ලක්ෂණ 04 ක් දක්වන්න. (ල.04)

06. සෑම ආයතනයක් තුළම විධිමත් ආකාරයෙන් මෙන්ම අවිධිමත් ආකාරයෙන් ද සන්නිවේදනය සිදු වේ.

(i) අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ 02 ක් දක්වන්න. (ල.01)

(ii) ආයතනයක් තුළ බාහිර මෙන්ම අභ්‍යන්තර සන්නිවේදනය සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමට බහුලවම යොදා ගන්නා මාධ්‍ය උපකරණයක් නම් කර එය භාවිතයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම 02 ක් දක්වන්න. (ල.02)

(iii) ආයතනය තුළ විධිමත් ආකෘති අනුව ද සන්නිවේදන ක්‍රියාවලිය සිදුවේ. විධිමත් සන්නිවේදන ආකෘති නම් කර 02 ක් හඳුන්වන්න. (ල.03)

(iv) ආයතනය විසින් වෙබ් අඩවියක් ද පවත්වා ගෙන යයි. වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි 04 ක් දක්වන්න. (ල.04)

07. (i) ''සිනමා හා රූපවාහිනි මාධ්‍යයේ නිශ්චල ඡායාරූප භාවිතා නොවේ.''
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතුවක් දක්වන්න. (ල.01)

(ii) ''රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ව්‍යුහය සමාන වේ.''
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න. (ල.02)

(iii) ''අංකිත තාක්ෂණය අද බොහෝ කටයුතු සඳහා යොදා ගනියි.''
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු තුනක් දක්වන්න. (ල.03)

(iv) ''ජනමාධ්‍ය අන්තර්ගතය තුළ වැඩි වශයෙන් දැකිය හැකි වන්නේ ළමා ග්‍රාහකයන්ය.''
ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු හතරක් දක්වන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(2) | 3 -(1) | 4 -(2) | 5 -(2) | 6 -(3) | 7 -(3) | 8 -(4) | 9 -(1) | 10 -(3) |
| 11-(4) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(2) | 16 -(4) | 17 -(3) | 18 -(1) | 19 -(2) | 20 -(4) |
| 21-(4) | 22 -(2) | 23 -(1) | 24 -(4) | 25 -(2) | 26 -(1) | 27 -(3) | 28 -(3) | 29 -(4) | 30 -(3) |
| 31-(3) | 32 -(2) | 33 -(2) | 34 -(1) | 35 -(4) | 36 -(3) | 37 -(2) | 38 -(1) | 39 -(2) | 40 -(4) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගිනි)

01 (i) පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව

(ii) මාධ්‍ය විචාරකයෙකු ලෙස

(iii) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

(iv) මාධ්‍ය බාධක / තාක්ෂණික බාධක

(v) උඩුකුරු පිරමීඩ සංකල්පය

(vi) සදාචාරාත්මක අයිතිවාසිකම

(vii) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශිත මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(viii) තොරතුරු සම්පාදනය

(ix) ජංගම දුරකථනය, අන්තර්ජාලය

(x)
- තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කරමින් අන් අය රැවටීම.
- වැරදි හා අසත්‍ය තොරතුරු සමාජ ජාලවලට එක් කිරීම.
- තමන්ගේ පෞද්ගලික තොරතුරු අනවශ්‍ය අය වෙත ලබා දීම.
- අන් අයගේ පෞද්ගලිකත්වයට හානි කිරීම ආදී කරුණුවලින් දෙකක් දක්වා තිබිය යුතුයි.

(ල. 2 x 10 = 20)

02. (i) දෘශ්‍ය සන්නිවේදන ස්වරූපයට (ල.01)

(ii)
- ඉහළ සිට පහළට - විදුහල්පතිතුමා මඟින් නිවේදන, ලිපි, දැන්වීම් ශබ්ද විකාශන පද්ධති මඟින් සන්නිවේදනය සිදු කිරීම.
- පහළ සිට ඉහළට - ගුරු සාකච්ඡා, අංශ රැස්වීම්, කමිටු රැස්වීම් ආදිය මඟින් සිසු හා ගුරු අදහස් විදුහල්පතිතුමා වෙත යොමු කිරීම.
- හරස් සන්නිවේදනය - සිසුන් සිසුන් අතර, ගුරුභවතුන් ගුරුභවතුන් අතර සන්නිවේදනය සිදු වීම. මේ සඳහා මුහුණට මුහුණලා කරන කතාබහ, අභ්‍යන්තර දුරකථන පද්ධති යොදා ගැනීම. (ආදී කරුණු කෙටියෙන් විස්තර කළ යුතුය.) (ල.02)

(iii) ලැමිනේටින් යන්ත්‍රය, බැඳුම් උපකරණ හා ද්‍රව්‍ය, කැපුම් යන්ත්‍රය (නම් කිරීමට ල. 1 + විස්තර කිරීම ල.02 = ල.03)

(iv) සමාජ ප්‍රතිරූපය යනු යම් පුද්ගලයෙකුගේ පෙනුම, හැකියාව, දක්ෂතාවය ආදිය මත සමාජය විසින් ඔහුට ලබා දී ඇති වටිනාකමයි. (ල.04)

03. (i) ආර්ථික නියෝජන අංශය, සමාජ නියෝජන අංශය, ආගමික හා සදාචාරාත්මක නියෝජන අංශය, සෞන්දර්යාත්මක නියෝජන අංශය (ල.01)

(ii) නීති ගරුක වීම, බදු ගෙවීම, දේශාභිමානීව කටයුතු කිරීම, සියලු ආගම්වලට හා ජාතීන්ට ගරු කිරීම, ආචාරශීලී වීම හා ගුණ ගරුක වීම ආදිය. (ල.02)

(iii)
- වැඩලෝකයේ ගතික ස්වභාවය පිළිබඳව තරුණ තරුණියන් දැනුවත්කරන වැඩසටහන් ඉදිරිපත් කිරීම.
- වැඩ ලෝකය ඉල්ලා සිටින පුද්ගල ගුණාංග පිළිබඳව (සුදුසුකම්, පළපුරුද්ද, හැකියාවන් ආදිය) ඔවුන්ව දැනුවත් කිරීම.
- විවිධ රැකියාවන් පිළිබඳව ඇති ආකල්ප වෙනස් කිරීමට කටයුතු කිරීම.
- විවිධ රැකියා ඔස්සේ ජයග්‍රහණ ලබා ඇති චරිත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ආදිය. (ල.03)

(iv) මාධ්‍ය අතර තරඟකාරීත්වය, දේශපාලන අරමුණු ඉටු කිරීම, ග්‍රාහක ඉල්ලුම, ගෝලීයකරණයේ බලපෑම්, බහුජාතික සමාගම්වල බලපෑම්, මාධ්‍ය හිමිකාරිත්වයේ බලපෑම් ආදී කරුණු 04 ක් විස්තර කර තිබිය යුතුය. (ල.04)

04. (i) ආයතනය මගින් මාසිකව වැටුප් ලබා ගැනීම, වෘත්තීය මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කිරීම, උසස්වීම්, වරප්‍රසාද හිමිවීම (ල.01)

(ii) • කතු වැකිය හෙවත් සංස්කාරක වැකිය ලිවීම.
• ප්‍රධාන කර්තෘගේ කාර්යය පහළ තනතුරු දරන මාධ්‍යවේදීන් වෙත බෙදා දීම.
• නීතිමය කටයුතුවල දී මූලික වගකීම දැරීම. (ල.02)

(iii) පාලන හා මුදල් අංශය, දැන්වීම් අංශය, කර්තෘ මණ්ඩල අංශය, නිෂ්පාදනය හා අලෙවි අංශය (නම් කිරීමට ල. 1 + විස්තර කිරීමට ල. 2 = ල.03)

(iv) මුද්‍රිත පුවත්පතෙහිම විද්‍යුත් පිටපත, අන්තර්ජාලයෙහි පමණක් ම පළකෙරෙන විද්‍යුත් පුවත්පත්. (ල.04)

05. (i) වීඩියෝ කැමරාවක් (ල.01)

(ii) නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව විස්තර කර තිබිය යුතුය. (ල.02)

(iii) • ක්ෂණිකව ආයතනය වෙත යැවීමට හැකි වීම.
• වීඩියෝ ඡායාරූප ආදිය ද යැවිය හැකි වීම.
• එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දිය හැකි වීම.
• සාපේක්ෂව මිල අඩු වීම ආදී කරුණු 03 ක් විස්තර කර තිබිය යුතුය. (ල.03)

(iv) අදාල සියලු විස්තර ඇතුළත් වී තිබීම, අනවශ්‍ය දෑ ඇතුළත් නොවීම, රාමුව තුළ ඡායාරූපිත වස්තූන් මනාව සංවිධානය කිරීම, උචිත කැමරා කෝණ භාවිත කිරීම, නිවැරදි ආලෝකය යොදා ගැනීම. (ල.04)

06. (i) • සංදේශය ලබා දෙන පුද්ගලයෙකු හඳුනාගත නොහැකි වීම.
• වේගයෙන් සංදේශය පැතිරී යාම.
• සංදේශය වෙනස්වීම්වලට, විකෘති වීම්වලට භාජනය වීම.
• සන්නිවේදනය ආරම්භ වන ස්ථානය කොතනින් දැයි කිව නොහැකි වීම. (ල.01)

(ii) දුරකථනය - • දෙපාර්ශවයේ ම ගෞරවය රැකෙන පරිදි වචන භාවිතා කිරීම.
• කිව යුතු දේ කෙටියෙන් කීම.
• ඇමතුම ලබා ගැනීමට පෙර අවශ්‍යතාවය නිවැරදිව දැන ගෙන එයට නිසි ලෙස සූදානම් වීම.
• විසඳා ගත නොහැකි ප්‍රශ්න සඳහා දුරකතනය භාවිතා නොකිරීම ආදී කරුණු. (ල.02)

(iii) චක්‍රීය ආකෘතිය, දාම ආකෘතිය, වයි ආකෘතිය, රෝද ආකෘතිය (ල.03)

(iv) • ආයතනයේ තොරතුරු ලෝකය පුරා සිටින ඕනෑම අයෙකුට ලබා ගත හැකි වීම.
• ආයතනයේ තොරතුරු යාවත්කාලීන කළ හැකි වීම.
• ආයතනයේ කටයුතු සමාජයට විවෘත වීම.
• තොරතුර වේගවත්ව නිකුත් කළ හැකි වීම.
• වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර ලබා ගත හැකි වීම. ආදිය...., (ල.04)

07. (i) එකඟ විය නො හැකිය - රූගත කිරීම්වල දී පාත්‍ර වර්ගයාගේ දර්ශන තලවල අංග රචනා, වස්ත්‍රාභරණ ආදියේ අඛණ්ඩතාවය පවත්වා ගැනීමට, ප්‍රචාරණයේ දී පෝස්ටර්, පත්‍රිකා පුවරු, පින්තූර ආදියට ඇතුළත් කිරීමට, මුද්‍රිත මාධ්‍යයන් හරහා කරන වෙළඳ දැන්වීම් ආදිය සඳහා නිශ්චල ඡායාරූප භාවිතා කෙරේ. (ල.01)

(ii) එකඟ විය නොහැකිය - රාජ්‍ය මාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ව්‍යුහය තුළ වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් සිටියි. පෞද්ගලික ආයතනයක වෘත්තියක් සීමිත සංඛ්‍යාවක් සිටියි. රාජ්‍ය මාධ්‍ය ආයතනයක එක් එක් පුද්ගලයන්ට වෙන් වෙන් වූ කාර්ය භාරයන් දක්වා ඇත. එහෙත් පෞද්ගලික මාධ්‍ය ආයතනයක එක් පුද්ගලයෙකු විසින් කාර්යය කිහිපයක නිරත වෙයි. (ල.02)

(iii) එකඟ විය හැකිය - ඡායාරූප තාක්ෂණය සඳහා යොදා ගැනීම, මුද්‍රණ ක්‍රම සඳහා යොදා ගැනීම, රූපවාහිනී විකාශන කටයුතු සඳහා යොදා ගැනීම. (ල.03)

(iv) එකඟ විය හැකිය - කාටූන් චිත්‍රපට වැඩි වශයෙන් ප්‍රදර්ශනය කිරීම, අධ්‍යාපනික වැඩසටහන් ඉදිරිපත් කිරීම. විනෝද ක්‍රීඩා වැඩසටහන් ඉදිරිපත් කිරීම. දැනුම මිනුම වැඩසටහන් ඉදිරිපත් කිරීම. පාසල් නිවාඩු කාලය තුළ ළමයින් වෙනුවෙන් විශේෂ වැඩසටහන් ඉදිරිපත් කිරීම. ළමයින් වෙනුවෙන් වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීම. (ල.04)